මගේ අංකය: SP/PSC/**31**/OP/04/2020
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
6වන මහළ, ගාල්ල.
2020.08.28

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්,
පළාත් පාලන කොමසාරිස්,
පළාත් පාලන සහකාර කොමසාරිස් (ගාල්ල/ මාතර/ හම්බන්තොට),

**<u>දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019 (2020)</u>**

1.0 අංක 221 හා 2011.06.13**,** දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද, 2013.11.19**,** 2015.08.06 හා 2016.07.18 දිනැතිව සංශෝධිත, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020 නොවැම්බර් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාග ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. බඳවා ගැනීම් සිදුකරන අවස්ථාවේදී බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

3.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට අදාල වැටුප් කාණ්ඩය MN3- 2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 31,040-10x445-11x660-10x730- 10 x750- 57,550 ක් වේ.

4.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

5.0 සුදුසුකම් :- මෙම විභාගය සඳහා තරඟ කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අයදුම්කරුවෙකුටම පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(අ) දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාල සහායක / පුස්තකාල සේවක තනතුරේ ස්ථිර කර තිබීම සහ එම තනතුරේ වසර 10ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම සහ අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (මේ සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

සහ

(ආ) I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම.

හෝ

II. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම.

6.0 විභාග පරිපාටිය :-

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| විෂයය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| (I) පුස්තකාල විද්‍යාව | පැය 03 යි | 100 යි | 40% |
| (II) බුද්ධි පරීක්ෂණය | පැය 01 යි | 100 යි | 40% |
| (III) සාමාන්‍ය දැනීම | පැය 01 යි | 100 යි | 40% |

ඉහත විෂයන්ට අදාළ විෂය නිර්දේශ පහත පරිදි වේ.

6.1 **පුස්තකාල විද්‍යාව :-**

(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය
(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය
(ආ) පුස්තකාලයන්හි සාමාජික කාර්යභාරය
(ඇ) පොත් හා විවිධ ලේඛන හා මුද්‍රිත නොවන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශය
(ඈ) විද්වත් වෘත්තීය සංගම්
  (i) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
  (ii) ඇමරිකානු හා බ්‍රිතාන්‍ය පුස්තකාල සංගම්

(ඉ) පුස්තකාල වර්ග -

  (i) පාසල් හා විද්‍යායතන පුස්තකාල
  (ii) රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පුස්තකාල
  (iii)මහජන පුස්තකාල
(ඊ) පුස්තකාල කමිටු
(උ) සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)

(2) දැනුම සහ තොරතුරු සංවිධානය

(අ) ග්‍රන්ථ වර්ගීකරණය හා එහි අරමුණු සහ ප්‍රයෝජන
(ආ) ග්‍රන්ථ වර්ගීකරණයක මූලිකාංග
(ඇ) දශම වර්ගීකරණය
(ඈ) සූචිකරණය, එහි අරමුණු
(ඉ) AACR සූචිකරණ නීති සංග්‍රහය
(ඊ) සංලේඛය හා ග්‍රන්ථ විස්තරය
(උ) සූචි වර්ග

(3) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා

(අ) විවිධ පුස්තකාල සම්පත්
(ආ) පුස්තකාල සම්පත් තේරීම හා තේරීමේ ක්‍රියාවලිය
(ඇ) ප්‍රතිග්‍රහණය හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය
(ඈ) පිරිසැකසුම්කරණය
(ඉ) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (Information Communication Technology)
(අ) පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණක තාක්ෂණයේ බලපෑම

- කාලය පැය 03යි

6.2 බුද්ධි පරීක්ෂණය :-

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි

6.3 සාමාන්‍ය දැනුම :-

ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත් භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි

**සටහන:**

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් බැගින්වත් (40%) අපේක්ෂකයකු විසින් ලබාගත යුතුවන අතර, සීමිත තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

7.0 විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු. 600/- කි. මෙම මුදල **දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13**ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි **ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට** ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, **විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාල වලට ගෙවන ලද මුදල්ද භාරගනු නොලැබේ.**

8.0 අයදුම්පත්‍ර :- ඒ 4 (සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 01 සිට 03.4 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,
(ආ) අංක 04 සිට ඉදිරියටවන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත්වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම අයදුම්පත්‍රය පිරවිය යුතු ය.
(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

8.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.sp.gov.lk** මඟින්ද ලබා ගත හැකිය.

8.2 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.3 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)"** යන්න සඳහන් කරන්න.

8.4 විභාග ප්‍රතිඵල:
මෙම නිවේදනයෙහි 6.0 සටහනට අනුව එක් එක් විෂයයෙන් ලකුණු 40%ට නොඅඩුව ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය **www.psc.sp.gov.lk** වෙබ් අඩවියේ පල කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරනු ඇත.

9.0 අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කර තිබිය යුතු අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු බැවින් නියමිත දිනට ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි අයදුම්කරුවන් විසින් කල් වේලා ඇතිව තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2020 සැප්තැම්බර් මස 18 වැනි දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
6වන මහළ, ගාල්ල.

10.0 විභාගයට පෙනී සිටීම - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහා ම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ (ආයතනික හා විදේශ විභාග), ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු විසින්, තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් 011 2784232 ෆැක්ස් අංකය වෙත යොමුකරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත්

අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

11.0 පත්වීම සඳහා අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය. අයදුම්පතේ අගට යොදා ඇති අන්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.1 අත්සන සහතික කිරීම: අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා තිබිය යුතුය.

11.2 සෑම අයදුම්කරුවකුම විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

12.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුලත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකිවන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය. යම් හෙයකින් විරෝධතාවක් මතු කළහොත් විභාගයට පෙනී සිටීමට ඉඩදිය හැක. කෙසේ වුවද අනන්‍යතාව තහවුරු කර ගැනීමට නොහැකි බැවින්, එවැනි විභග අපේක්ෂකයන්ට ප්‍රතිඵල නිකුත් නොකෙරේ.

13.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :- ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය ඕනෑම අවස්ථාවක රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

14.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම විභාග නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**කේ.එල්. දයානන්ද**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත.

(සැලකිය යුතුයි - ඔබ කාර්යාලයට අනුබද්ධව ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු, මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට ඉදිරිපත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් ඔවුන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.)